# කොන්ෆියුසියස් දහමෙහි ඇතුළත් සමාජ සබඳතා පඤ්චකය හා සිඟාලෝවාද සූත්‍රය

*චින්තා පවිත්‍රානි* [1]

චීනයේ ප්‍රධාන දාර්ශනික චින්තන සම්ප්‍රදාය නියෝජනය කරන්නේ තාඕ දර්ශනය ඉදිරිපත් කළ ලාඕත්සතුමා සහ කොන්ෆියුසියස් දහම ඉදිරිපත් කළ කොන්ෆියුසියස්තුමාය. කොන්ෆියුසියස්තුමාගේ මූලික ඉගැන්වීම් අතර **'රෙන්'** යනුවෙන් හැඳින්වෙන පරිපූර්ණ මනුෂ්‍යයා (gentlemen) පිළිබඳ සංකල්පය ප්‍රධාන වේ. තත්කාලීන සමාජ-දේශපාලන පරිස්ථිතියෙහි චිරජීවනය කෙරෙහි මූලික අවධානයක් යොමු කළ මෙතුමා සදාචාරාත්මක සමාජ පසුබිමක් ගොඩනගනු වස් ස්වකීය දර්ශනය උපකාර කරගත්තේය. එහිදී පළමුව පුද්ගල සදාචාරයද ඒ ඔස්සේ සමාජ සදාචාරයද ගොඩනැගිය හැකි බව මෙතුමාගේ අදහස විය. ඒ ඇසුරින් අන්තර් සමාජ සබඳතා ගොඩනැගීම මෙන්ම නිසි ලෙස පවත්වාගෙන යාමද යුක්තිගරුක, ධාර්මිෂ්ඨ, සදාචාර සම්පන්න සමාජයක පදනම බව ඉගැන්විණි. ඊට අදාළව කොන්ෆියුසියස්තුමා ඉගැන් වූ **'සමාජ සබඳතා පඤ්චකය'** විවිධ සමාජ ඒකක අතින් ඉටු විය යුතු යුතුකම් මැනවින් අවධාරණය කරයි. පාලකයා-පාලිතයා, පියා-පුතා, ස්වාමියා-භාර්යාව, වැඩිමහල් සහෝදරයා-බාල සහෝදරයා, මිත්‍රයා-මිත්‍රයා යන සමාජ ඒකක ඔවුනොවුන්ට ඉටු කළ යුතු යුතුකම් සමුදායක් එහි ලා දක්නට ලැබේ. බුද්ධ දේශනාවන්හිද මේ හා සමාන ඉගැන්වීමක් හමු වන බව අවධානයට නිසි කරුණකි. ඒ දීඝ නිකායේ හමු වන සිඟාලෝවාද සූත්‍රයේය. එහි ලා බුදුරදුන් උතුර, දකුණ, බටහිර, නැගෙනහිර, උඩ, යට යන සදිසාව නමස්කාර කරන සිඟාල ගෘහපතියාට ඒ වෙනුවට සමාජ සබඳතා සයක් හඳුන්වා දෙයි. එනම්, මව්-පිය-දූ-දරු, ගුරු-සිසු, ස්වාමි-භාර්යා, ශ්‍රමණ-දායක, සේවක-සේව්‍ය, මිත්‍ර-මිත්‍ර යන සමාජ සබඳතා වේ. කොන්ෆියුසියස්තුමාගේ මෙම ඉගැන්වීම හා බෞද්ධ ඉගැන්වීම අතර එතරම් පරතරයක් නොමැති බව පැහැදිලිව පෙනේ. මෙම ශාස්තෘවරුන් දෙදෙනා මිනිස් සමාජය උත්තුංග ගුණාංගයන්ගෙන් සපිරි වඩා යහපත් ස්ථානයක් බවට පත් කිරීමට දැරූ වෑයම හේතුවෙන්ද එම ඉගැන්වීම් සමාන වේ. තත්කාලීන සමාජ පරිස්ථිතියේ පැවති විවිධ සමාජ අර්බුද අවම කරමින් යුතුකම් හා වගකීම් හඳුනන ජන සමාජයක් බිහි කරලීමට එම ඉගැන්වීම් දායක වූයේය. කේවල පුද්ගල අභ්‍යන්තරය මැනවින් සංවර්ධනය කිරීම හා සමාජ සබඳතා ක්‍රමවත් කරලීම ඒ පදනමෙහි පැවති මූලික කරුණු වූ බව පැහැදිලිය.

යථෝක්ත සාධක මත පදනම්ව කොන්පියුසියස්තුමා දැක් වූ සමාජ සබඳතා පඤ්චකය හා බුදුරදුන් වදාළ සමාජ සබඳතා සය පිළිබඳ තුලනාත්මකව විග්‍රහ කිරීමට අවකාශ පවතී.

**ප්‍රමුඛ පද** : සිඟාලෝවාද සූත්‍රය, සමාජ සබඳතා, සදාචාරය, දර්ශනය, සදිසාව

[1] *සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව. chinthapawithrani@gmail.com*